අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

+9411 2784161
+9411 2784869
moepressroom3@gmail.com

මාධ්‍ය නිවේදනය | ஊடக வெளியீடு | MEDIA RELEASE

MEDIA UNIT

EDU-0165

2026-07-21

## දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල සේවයේ නියුතු ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන් සඳහා වන II කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026

2026 සැප්තැම්බර් මස පැවැත්වීමට නියමිත දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල සේවයේ නියුතු ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන් සඳහා වන II කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වන ගැසට් නිවේදනය 2026.07.17 දින පළ කෙරිණි.

මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා 2026.07.20 දින සිට 2026.08.10 දින දක්වා අයදුම්පත් , ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වෙත පිවිස මාර්ගගත ක්‍රමය ඔස්සේ යොමු කළ හැකිය.

ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 - II ශ්‍රේණියට අධ්‍යාපනවේදී උපාධිය මත සෘජුව බඳවා ගත් ගුරුවරුන් හැර එම ශ්‍රේණියට උසස්වීම් ලද හෝ ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 ශ්‍රේණියට බඳවා ගැනීමෙන් අනතුරුව 2- II ශ්‍රේණියට පත් කරන ලද ගුරුවරුන් 2- II ශ්‍රේණියේ සේවා කාලය වසර 04ක් ගත වීමට පෙර මෙම II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කළ යුතුය. තවද 2025.06.30 ට පෙර II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ නොකළද එකී අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට යටත්ව 2 - I ශ්‍රේණියට උසස් කරන ලද ගුරුවරුන් ද , ගුරු සේවයේ 1 ශ්‍රේණියට තවදුරටත් උසස්වීම් ලැබීමට නම් මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කිරීම අත්‍යාවශ්‍ය වේ.

මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාළ ස්වයං අධ්‍යයන මොඩියුලයන්හි විෂය නිර්දේශය ගැසට් නිවේදනයේ දක්වා ඇති පරිදි අධ්‍යාපන අමාත්‍යාංශයේ e – thaksalawa නිල වෙබ් අඩවියේ පළ කර ඇත.

මෙම විභාගය සඳහා පෙනී සිටින විභාග අපේක්ෂකයින්ට ස්වයං අධ්‍යයන ක්‍රමවේදය නිර්දේශ කරන අතර පහත දැක්වෙන සබැඳිය (Link) මගින් e - thaksalawa වෙබ් අඩවිය වෙත පිවිස එහි II කාර්යක්ෂමතා කඩඉම් විභාගය යටතේ ඉදිරිපත් කර ඇති විෂය කරුණු අධ්‍යයනය කිරීම තුළින් විභාගයට පෙනී සිටීමට දිරිමත් කරනු ලැබේ.

https://e-thaksalawa.moe.gov.lk/lcms/course/view.php?id=1065

"ඉසුරුපාය", බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. "இசுருபாய", பத்தரமுல்ல, இலங்கை. "Isurupaya", Battaramulla, Sri Lanka.
+9411 2785141-50 +9411 2784848 education@moe.gov.lk www.moe.gov.lk